# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2394/11 - 2024 ජූලි මස 22 වැනි සඳුදා - 2024.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූලි මස 09 වැනි දින අංක 24/1304/631/032 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවටත්;

(ආ) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවටත්;

(ඇ) පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත්, සහ

(ඈ) නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවලදී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 19 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 6777 — 289 (2024/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| I වන උපලේඛනය<br><br>ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම | කේපීඑම්ජී ප්‍රොෆෙෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>(KPMG PROFESSIONAL SERVICES (PRIVATE) LIMITED) |
| 2. බලපත්‍ර අංකය | 2311140027 |
| 3. බලපත්‍රය නිකුත් කරන ලද දිනය | 2023 දෙසැම්බර 01 බල පත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය.<br>(2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝග වල 27 වන නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | PCC00289495 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරය |
| 6. නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් සඳහා හිමිකම | KPMG PROFESSIONAL SERVICES (PRIVATE) LIMITED ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 04 වන දින අංක 2343/60 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝග වල 4(2)(ඉ) සහ 4(3)(ආ) වන නියෝග වල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනාක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනාක්‍රමය |

## II වන උපලේඛනය

## ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු

ව්‍යාපාර, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර ලෙස නම් කිරීමේ දී, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 (5) වන වගන්තියේ දක්වා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා, එකී පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැළකිල්ලට ගනු ලැබ ඇත.

KPMG යනු විගණන, බදු සහ උපදේශක සේවා වැනි වෘත්තීය සේවාවන් සපයන ස්වාධීන වෘත්තීය සාමාජික ව්‍යාපාර ආයතනයන්හි ගෝලීය ජාලයකි. KPMG ජාලයේ ස්වාධීන සාමාජික ව්‍යාපාර ආයතන ඇපයෙන් සීමිත එක්සත් රාජධානි සමාගමක්වන KPMG International Limited සමග අනුබද්ධ වේ. KPMG International Limited සහ එහි ආශ්‍රිත අස්ථිත්‍යයන් (entities) සේවාලාභීන් වෙත සේවා සැපයීම සිදු නොකරන නමුදු, සෑම KPMG ව්‍යාපාර ආයතනයක්ම නෛතික වශයෙන් එකිනෙකින් වෙනස් සහ වෙන් වූ අස්ථිත්‍යක් වන අතර ඒවායෙහි අදාළ භූගෝලීය ප්‍රදේශයන් තුළ සේවා සපයන ව්‍යාපාර ආයතන වශයෙන් හඳුන්වනු ලැබේ. KPMG Sri Lanka සමාගම, විශාලතම වෘත්තීය සේවා ව්‍යාපාර ආයතන වලින් එකක් වන අතර 1897 දී ආරම්භ කර ශත වර්ෂයකට අධික කාලයක් පුරා පැවත එන රටේ පැරණිතම වරලත් ගණකාධිකරණ ව්‍යාපාර ආයතනය ද වන්නේ ය. වර්තමානය වන විට KPMG Sri Lanka සතුව හවුල්කරුවන් 19 ක ගෙන් ද, 1000 කට අධික වෘත්තිකයන් සහ සහායක ව්‍යාපාරවලින් ද, සමන්විත වන සම්පත් පදනමක් ඇත. ව්‍යාපාර ආයතනයේ සේවා පරාසය බාහිර විගණන සේවා, බදු සේවා, අභ්‍යන්තර විගණන සහ අවදානම් පිළිබඳ උපදේශන සේවා, ගිණුම්කරණ උපදේශක සේවා, තොරතුරු තාක්ෂණ උපදේශක සේවා, ගනුදෙනු පිළිබඳ උපදේශක සේවා, කළමනාකරණ උපදේශක සේවා සහ මානව සම්පත් උපදේශක සේවා වැනි ක්ෂේත්‍ර දක්වා ව්‍යාප්ත වේ.

KPMG PROFESSIONAL SERVICES (PRIVATE) LIMITED සමාගම, KPMG International Limited හි බලපත්‍රලාභියකු වන KPMG Sri Lanka හි උප බලපත්‍රලාභියකු වන KPMG Holdings (Private) Limited හි පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධිත සමාගමකි. KPMG PROFESSIONAL SERVICES (PRIVATE) LIMITED විසින් ඔවුන්ගේ වෘත්තීය සේවාවන් කොළඹ වරාය නගරය තුළ සිටින සේවාලාභීන්ට මෙන්ම විදේශයනහි සිටින සේවාලාභීන් සහ KPMG සාමාජික ව්‍යාපාර ආයතන වෙතද අපනයනය කරයි. KPMG ජාලය තුළ ප්‍රධාන ක්‍රියාකරුවකු වශයෙන් මෙහෙයුම් සිදු කරන KPMG PROFESSIONAL SERVICES විසින්, බැංකු සහ මූල්‍ය කටයුතු, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම සම්බන්ධ විසඳුම් ලබා දෙමින්, ශ්‍රී ලංකාව පදනම් කරගත් වෘත්තීකයන් කණ්ඩායමක් ස්ථාපිත කළ යුතුය.

මෙම ප්‍රයත්නය වෙනුවෙන් පහසුකම් සැලැස්වීම සඳහා සහ ව්‍යාපාරය පුළුල් කිරීමේ ක්‍රමෝපායික අරමුණක් සහිතව, කොළඹ වරාය නගරය තුළ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු පළමු වර්ෂය තුළ දී ආසන්න වශයෙන් සේවකයන් 50 දෙනෙකු සේවයේ යෙදවීමට ද, දෙවන වර්ෂයේ දී 30 ක් ද, තුන්වන වර්ෂයේ දී 20 ක් ද, හතරවන සහ පස්වන වර්ෂ වලදී30 ක් බැගින් ද වශයෙන් මෙහෙයුම් ආරම්භ කර පළමු වර්ෂ 5 ඇතුළත සමස්ත සංඛ්‍යාව 160 ක් වන පරිදි සේවකයන් බඳවා ගැනීමට KPMG Professional Services (Private) Limited අපේක්ෂා කරයි. මෙම වර්ධන සැලැස්මට අනුව වසර 5 ක් ඇතුළත සමස්ත වශයෙන් පුද්ගලයන් 160 ක සේවයට බඳවා ගනු ලැබේ. KPMG PROFESSIONAL SERVICES (PRIVATE) LIMITED සමාගම, මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පළමු වසර 5 ඇතුළත එ.ජ.ඩො. මිලියන 2 ක පමණ වාර්ෂික ආදායමක් උපයා ගැනීමේ අරමුණ සහිතව, කලාපය තුළ ප්‍රමුඛ වෘත්තීය සේවා සපයන්නකු වශයෙන් කටයුතු කරමින් ද, ආරම්භයේදී සෘජු විදේශ ආයෝජන වශයෙන් එ.ජ.ඩො. 10,000 ක් ආයෝජනය කරමින් ද, කොළඹ වරාය නගරයේ සංවර්ධනයට සක්‍රීය ලෙස සම්බන්ධ වීමට අපේක්ෂා කරයි.

## III වන උපලේඛනය

### පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් |
|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | (අ) සියලු ආදායම්, ලාභ සහ බෙදා දෙනු ලබන ලාභාංශ මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු වලින් නිදහස් කරනු ලැබිය යුතුය; |
| | (ආ) කරනු ලබන සියලුම ගෙවීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය; |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 5. 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතුය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරු බදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරි ගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරි ගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 03 වැනි දින අංක 2282/59 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

## IV වන උපලේඛනය

### ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් වල හෝ දිරිගැන්වීම් වල වලංගු කාලය

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ආරම්භ වන දිනය | අවසන් වන දිනය |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 5. 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 07 - 0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.